# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## සංවර්ධන නිලධාරී - II ශ්‍රේණිය සහ කළමනාකරණ සහකාර - II ශ්‍රේණිය (තාක්ෂණික නොවන ) තනතුරු සඳහා බඳවා ගැනීම අභ්‍යන්තර /බාහිර

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| තනතුර | සංවර්ධන නිලධාරී II<br>අභ්‍යන්තර/බාහිර | කළමනාකරණ සහකාර II (තාක්ෂණික නොවන) - අභ්‍යන්තර | කළමනාකරණ සහකාර II (තාක්ෂණික නොවන) - බාහිර |
|---|---|---|---|
| රැකියා විස්තරය | 1. වාර්තා, පොත් සහ ලෙජර් පවත්වාගෙන යාම.<br>2. විමර්ශන සහ සමීක්ෂණ පැවැත්වීම.<br>3. දත්ත/සංඛ්‍යාලේඛන රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම.<br>4. වාර්තා සහ ලේඛන සකස් කිරීම<br>5. කළමනාකරුවන්ගේ කාර්යයන් සඳහා සහාය වීම. | 1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පරිපාලන හා මෙහෙයුම් කටයුතුවලට අදාළ ලිපිගොනු, ලේඛන, පොත්, රෙජිස්ටර් සහ වාර්තා පවත්වාගෙන යාම.<br>2. ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් ගිණුම් සකස් කිරීම සහ ලෙජර, පොත් සහ වාර්තා පවත්වාගෙන යාම.<br>3. . මුදල් සහ පිළිගත් වෙනත් ගෙවීම් ආකාරයන් මගින් ලැබෙන ලැබීම් හා ගෙවීම් කටයුතු මෙහෙයවීම .<br>4. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ පුද්ගලික සහකාර තනතුරට අදාල සියලු රාජකාරි කටයුතු සිදු කිරීම.<br>5. ගබඩා නඩත්තුව සම්බන්ධ සියලුම කටයුතු සිදු කිරීම සහ වාර්තා හා සටහන් පවත්වාගෙන යාම.<br>6. කළමනාකාරිත්වයට අවශ්‍ය පරිදි ලිපි, වාර්තා සහ අනෙකුත් ලේඛන කෙටුම්පත් කිරීම සහ යතුරුලියනය කිරීම.<br>7. ඉඩම් සහ පරිශ්‍ර, පිරියත , යන්ත්‍රෝපකරණ, සහ අනෙකුත් වත්කම් පිළිබඳ ප්‍රසම්පාදනය, නඩත්තුව සහ කළමණාකරනය පිළිබඳ ලියකියවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.<br>8. අදාළ තොරතුරු බෙදා හැරීම සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවාවන් ලබා ගැනීමට බාහිර පාරිභෝගිකයින්ට සහාය වීම.<br>9. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පොදු දුරකථන හුවමාරුව මගින් ලබාදෙන දුරකථන පහසුකම් හැසිරවීම<br>10. රැස්වීම්, නිල උත්සව සහ අනෙකුත් වැඩසටහන් සංවිධානය කිරීමේදී කළමනාකාරිත්වයට සහාය වීම. | |
| අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් වාණිජ්‍යය, ගණකාධිකරණය, කළමනාකරණය,අලෙවිකරණය, භෞතික විද්‍යාව, තොරතුරු තාක්ෂණය, ගණිතය, සංඛ්‍යාලේඛන, නීතිය, ආර්ථික විද්‍යාව, පරිගණක විද්‍යාව, ඉලෙක්ට්‍රොනික හෝ විදුලි සංදේශ යන විෂයයන් පිළිබඳ උපාධිය. | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී භාෂාව/සාහිත්‍යය සහ අංක ගණිතය /ශුද්ධ ගණිතය /මූලික ගණිතය/වාණිජ ගණිතය ඇතුළුව විෂයයන් දෙකකට සම්මාන සහිතව එක් වරකදී විෂයයන් 06ක් සමත් වී තිබීම.<br><br>සහ<br><br>අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර අවම වශයෙන් වසර 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සඳහා සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයයන් 06 ක් සමත් වී තිබීම.<br><br>සහ<br><br>(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ සියලුම විෂයයන් (සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර)එකවර සමත් වී තිබිය යුතුය පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනක් (03) එකවර සමත් වීම මේ සඳහා ප්‍රමාණවත් වේ. |
| බඳවාගැනීමේ පටිපාටිය | ලිඛිත තරඟ විභාගයකින් අනතුරුව පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කෙරේ. ලිඛිත විභාගයේදී, එක් එක් විෂයයට ලකුණු 40 කට වඩා ලබා ගත යුතු අතර, විෂයයන් සියල්ලේම ලකුණු එකතුව 50% ට වඩා වැඩි විය යුතුය. ලිඛිත විභාගයේදී ලබා ගන්නා ලකුණු වලින් 60% ක එකතුවක් සහ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු වලින් 40% ක එකතුවක් පදනම් කරගෙන අවසාන තෝරා ගැනීම සිදු කරනු ලැබේ<br><br>ලිඛිත විභාගය සිංහල/ දෙමල භාෂාවෙන් පැවැත්වේ.<br><br>ලිඛිත තරඟ විභාගය සඳහා විෂයයන්;<br>(i) බුද්ධි පරීක්ෂණය - පැය 1<br>මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ තාර්කික හැකියාව, විශ්ලේෂණ ශක්තිය සහ ගණිත කුසලතා තක්සේරු කිරීම සඳහා වේ.<br><br>(ii) භාෂා ප්‍රවීණතාවය- පැය 2<br>ව්‍යාකරණ රීති යෙදීමේදී අපේක්ෂකයාගේ ප්‍රකාශන හැකියාව, අවබෝධය, අක්ෂර වින්‍යාසය සහ දැනුම තක්සේරු කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත.<br>සිංහල/ දෙමල භාෂාව - පැය 1<br>ඉංග්‍රීසි භාෂාව - පැය 1 | ලිඛිත තරඟ විභාගයකින් අනතුරුව පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කෙරේ. ලිඛිත විභාගයේදී එක් එක් විෂයයට අවම වශයෙන් 40% ක් ලබා ගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත විභාගයේදී ලබා ගන්නා ලකුණු වලින් 60% ක එකතුවක් සහ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු වලින් 40% ක එකතුවක් පදනම් කරගෙන අවසාන තෝරා ගැනීම සිදු කරනු ලැබේ<br><br>ලිඛිත විභාගය සිංහල/ දෙමල භාෂාවෙන් පැවැත්වේ.<br><br>ලිඛිත තරඟ විභාගය සඳහා විෂයයන්;<br>(i) භාෂා ප්‍රවීණතාවය - පැය 3<br>I කොටස - මව් භාෂාවේ ප්‍රකාශන හැකියාව, අවබෝධය, අක්ෂර වින්‍යාසය, රචනාව, ලිපි කෙටුම්පත් කිරීම, ඡේද සාරාංශ කිරීම යනාදිය .<br><br>II කොටස - ඉංග්‍රීසි භාෂාවෙන් අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ අවබෝධ කර ගැනීමේ හැකියාව, කෙටි ලිපි / සටහන් කෙටුම්පත් කිරීම, ව්‍යාකරණ සහ අක්ෂර වින්‍යාසය යනාදිය .<br><br>(ii) බුද්ධි පරීක්ෂණය - පැය 3<br>I කොටස - සංඛ්‍යා හා ගණනය කිරීම් ආදියෙහි කුසලතා පරීක්ෂා කිරීම.<br><br>II කොටස - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූලික නීති රීති, කළමනාකරණ සහකාරවරයෙකුට අදාළ කාර්යාල ක්‍රම, ලිපිගොනු , ලිපිගොනු ලේඛනය, චලන පත්‍ර, ඇමතුම් දිනපොත , වවුචර්, නිල මුද්‍රා පවත්වාගෙන යාම යනාදිය වැනි කාර්යාලයේ භාවිත කරන විවිධ ලේඛන සහ අයිතම සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.<br><br>(iii) පරිගණක පරීක්ෂණය - පැය 1<br><br>කළමනාකරණ සහකාරවරයෙකුට පවරා ඇති රාජකාරි ඉටු කිරීම සඳහා පරිගණකය භාවිතා කිරීමේ හැකියාව සහ මව් භාෂාවෙන් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ලේඛන නිවැරදිව ටයිප් කිරීමේ කුසලතා පරීක්ෂා කිරීම. | ලිඛිත තරඟ විභාගයකින් අනතුරුව පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කෙරේ. ලිඛිත විභාගයේදී, එක් එක් විෂයයට ලකුණු 40 % කට වඩා ලබා ගත යුතු අතර, විෂයයන් සියල්ලේම ලකුණු එකතුව 50% කට වඩා වැඩි විය යුතුය. ලිඛිත විභාගයේදී ලබා ගන්නා ලකුණු වලින් 60% ක එකතුවක් සහ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු වලින් 40% ක එකතුවක් පදනම් කරගෙන අවසාන තෝරා ගැනීම සිදු කරනු ලැබේ<br><br>ලිඛිත විභාගය සිංහල/ දෙමල භාෂාවෙන් පැවැත්වේ.<br><br>ලිඛිත තරඟ විභාගය සඳහා විෂයයන්;<br><br>(i) භාෂා ප්‍රවීණතාවය - පැය 3<br>I කොටස - මව් භාෂාවේ ප්‍රකාශන හැකියාව, අවබෝධය, අක්ෂර වින්‍යාසය, රචනාව, ලිපි කෙටුම්පත් කිරීම, ඡේද සාරාංශ කිරීම යනාදිය .<br><br>II කොටස - ඉංග්‍රීසි භාෂාවෙන් අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ අවබෝධ කර ගැනීමේ හැකියාව, කෙටි ලිපි / සටහන් කෙටුම්පත් කිරීම, ව්‍යාකරණ සහ අක්ෂර වින්‍යාසය යනාදිය ..<br><br>(ii) බුද්ධි පරීක්ෂණය - පැය 3<br>I කොටස - සංඛ්‍යා හා ගණනය කිරීම් ආදියෙහි කුසලතා පරීක්ෂා කිරීම.<br><br>II කොටස - කළමනාකරණ සහකාරවරයෙකුට අදාළ මූලික කාර්යාල ක්‍රම, ලිපිගොනු , ලිපිගොනු ලේඛනය, චලන පත්‍ර, ඇමතුම් දිනපොත , වවුචර්, නිල මුද්‍රා පවත්වාගෙන යාම යනාදිය වැනි කාර්යාලයේ භාවිත කරන විවිධ ලේඛන සහ අයිතම සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.<br><br>(iii) පරිගණක පරීක්ෂණය - පැය 1<br>කළමනාකරණ සහකාරවරයෙකුට පවරා ඇති රාජකාරි ඉටු කිරීම සඳහා පරිගණකය භාවිතා කිරීමේ හැකියාව සහ මව් භාෂාවෙන් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ලේඛන නිවැරදිව ටයිප් කිරීමේ කුසලතා පරීක්ෂා කිරීම. |

<table>
<tr>
<td></td>
<td><u>සම්මුඛ පරීක්ෂණය සඳහා වෙන් කර ඇති ලකුණු :</u><br><br>සුදුසුකම් (අවශ්‍ය මූලික සුදුසුකම් හැර)<br>i. පළමු හෝ දෙවන ඉහළ සාමාර්ථයක් සහිත උපාධියක් - ලකුණු 10<br>ii පශ්චාත් උපාධිය හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 15<br>iii. . ඉංග්‍රීසි ඩිප්ලෝමාව (මාස 12 කට නොඅඩු) - ලකුණු 10<br>iv. තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව (මාස 12 කට නොඅඩු) - -ලකුණු 10<br>v. පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික/ආශ්‍රිත සාමාජිකත්වය - ලකුණු 10<br>vi. අදාළ ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා පළපුරුද්ද (සෑම වසරකම ලකුණු 4) උපරිමය - ලකුණු 20<br>vii. . සම්මුඛ පරීක්ෂණයේදී කාර්ය සාධනය - <u>ලකුණු 25</u><br>මුළු ලකුණු <u>ලකුණු 100</u></td>
<td><u>සම්මුඛ පරීක්ෂණය සඳහා වෙන් කර ඇති ලකුණු :</u><br><br>i. අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී අංක ගණිතය/ගණිතය සඳහා විශිෂ්ට සාමාර්ථය / "A" සාමාර්ථය. - ලකුණු 4<br>ii. අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව සඳහා විශිෂ්ට සාමාර්ථය / "A" සාමාර්ථය - ලකුණු 4<br>iii. පිළිගත් ආයතනයකින් තොරතුරු තාක්ෂණය පිළිබඳව ලබාගත් සහතිකය - ලකුණු 4<br>iv. මනා සහභාගීත්වය, කාර්ය සාධනය, විශේෂ දායකත්වයන්, ප්‍රශංසා - ලකුණු 4<br>v. සම්මුඛ පරීක්ෂණයේදී කාර්ය සාධනය - <u>ලකුණු 4</u><br>මුළු ලකුණු - <u>ලකුණු 20</u></td>
<td><u>සම්මුඛ පරීක්ෂණය සඳහා වෙන් කර ඇති ලකුණු :</u><br><br>1.අධ්‍යාපන සුදුසුකම් :<br>i. පිළිගත් ආයතනයකින් පිරිනමනු ලබන කළමනාකරණ / මානව සම්පත් කළමනාකරණ/ මූල්‍ය/ ගිණුම්කරණ/ විගණන ඩිප්ලෝමාව (වසරකට නොඅඩු) - ලකුණු 05<br>ii.පිළිගත් ආයතනයකින් පිරිනමන ලද ඉංග්‍රීසි ඩිප්ලෝමාව (වසරකට නොඅඩු) - ලකුණු 05<br>iii. පිළිගත් ආයතනයකින් පිරිනමනු ලබන තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව (වසරකට නොඅඩු) - ලකුණු 05<br>2.වෘත්තීය සුදුසුකම් - ලකුණු 05<br>ICASL /CIMA/ACCA/CIM/AAT හි ආයතනයන්හි අර්ධ සුදුසුකම්<br>3. අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද: - ලකුණු 10<br>(පිළිගත් ආයතනයක ලිපිකරුවෙකු/ කළමනාකරණ සහකාරවරයෙකු හෝ ඒ හා සමාන තනතුරක සතුටුදායක සේවා කාලයක් සඳහා සෑම වසරකම ලකුණු 05ක්)<br>4.සම්මුඛ පරීක්ෂණයේදී කාර්ය සාධනය -ලකුණු <u>20</u><br>මුළු ලකුණු - <u>ලකුණු 50</u></td>
</tr>
<tr>
<td>වයස</td>
<td>අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.</td>
<td>අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.</td>
<td>අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.</td>
</tr>
<tr>
<td>වැටුප් පරිමාණය</td>
<td>TRC 6.1 - 105,101- (10x2112)-(10x2816)-(10x3519)-(10x4223) - 231,801</td>
<td colspan="2">TRC 8.2 - 89,336- (10x1408) -(10x2112)-(10x2816)-(10x3519) - 187,886</td>
</tr>
<tr>
<td>අයදුම් කිරීමේ ක්‍රමය</td>
<td colspan="3">1. අයදුම්පත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.trc.gov.lk. වෙතින් බාගත කර ගත හැකිය.<br>2. නියමිත ආකෘතිය අනුව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.<br>3. අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර, අවශ්‍යතා සපුරා ලනු නොලබන අයදුම්පත් සලකා බලනු නොලැබේ.<br>4. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහතිකවල පිටපත් සහ සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර සමඟ එවිය යුතුය.<br>5. බාහිර අයදුම්කරුවන් සඳහා : සියලුම අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් සහිතව 2025.08.09 දින හෝ එදිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.<br>6. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා : අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල සහතික කළ පිටපත් සමඟ අංශ ප්‍රධානියාගේ නිර්දේශය සහිත අයදුම්පත් 2025.08.09 දින හෝ එදිනට පෙර අධ්‍යක්ෂ ජනරාල් වෙත භාර දිය යුතුය.</td>
</tr>
<tr>
<td>පොදු කොන්දේසි</td>
<td colspan="3">1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.<br>2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සලකා බලනු නොලැබේ.<br>3. බඳවා ගැනීම සම්බන්ධයෙන් ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ<br>4. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ සම්පූර්ණ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.<br>5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) නියාමන අධිකාරියක් වන අතර , කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ඕනෑම තැනැත්තකු විසින් ඔහුගේ / ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත් කිරීම හෝ රැකියාවක නිරත වීම උදෙසා ඍජුව හෝ වක්‍රව අනුබල දීම / දිරි ගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය.</td>
</tr>
</table>

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක 276
ඇල්විටිගල මාවත
කොළඹ 08